www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොටස් වෙළඳපොලේ ව්‍යාජ රැලිවීම - ඉතිහාසය අපට කියන්නේ කුමක් ද?

## The stock market's false rallies—what history tells us

**ටොම් එලී විසිනි**
**2008 ඔක්තෝබර් 15**

ඊයේ දිනය තුල ලොව පුරාම කොටස් වෙළඳපොලවල කොටස් අගයන්ගේ පිම්බීම, පෙර සතියේ ඩොලර් ට්‍රිලියන ගනනක් වටිනාකම් අතුගෑවී ගිය වැටීමෙන්, පාර්ශවීය ගොඩ ඒමක් සලකුනු කරයි. එසේ ම, එක්සත් ජනපද හා යුරෝපීය ආන්ඩු මෙන්ම මහ බැංකු විසින්, ලෝකයේ ලොකුම බැංකුවලට ඩොලර් බිලියන සිය ගනනක් සඳහා ලබා දුන් පොරොන්දුව කෙරෙහි මූල්‍ය ප්‍රභූවේ පලමු ප්‍රතිචාරය ද මෙම රැලිවීමෙන් පිලිබිඹු විය.

ප්‍රසිද්ධියේ කොටස් අලෙවි කරන ප්‍රමුඛ සමාගම් 30 කොටස් වටිනාකම් මැන බලන, ඩව් ජෝන්ස් කාර්මික සාමාන්‍ය දර්ශකය එක් දිනක් තුල සියයට 11 කින් නැගුනේ, ප්‍රතිශත වශයෙන් පස්වන ලොකුම ඉහල නැඟීමත්, ඒකක වශයෙන් විශාලතම ඉහල යාමත් වාර්තා කරමිනි. මෙම රැලි වීමත් සමඟ යුරෝපයේ කොටස් වෙළඳපොලවල තියුනු වර්ධනයක් හා ආසියානු වෙළඳපොලවල ඊටත් වඩා වැඩි ඉහල නැඟීමක් ද වාර්තා විය.

එවන් කැලඹිලිකාරී තත්වයන් හි දී, 4 වන දින රැලිවීම, කොටස් වෙළඳපොලවල් ස්ථායී වීම පිලිබඳ නිමිත්තක් ද නැද්ද යන්න පිලිබඳව කිසිදු නිරවද්‍යතාවක් සහිතව, කල්තියා කිව නොහැකි ය. කෙසේ වුව ද, කොටස් වෙළඳපොල ඉතිහාසයේ විශාලතම රැලිවීම් සැලකිල්ලට ගත් කල්හි, 4 වන දින කොටස් වටිනාකම්වල උල්කාශ්මික නැග්ම, නොවරදින සුලු අන්තරායක් ලෙස ගත යුතු ය.

ඔක්තෝබර් 3 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නලය* ප්‍රකාශයට පත් කල දත්ත පෙන්නුම් කරන්නේ, වෝල් වීදියේ ඉතිහාසයෙහි ලොකුම දින 10 න්, 8 ක්ම දැක ගත හැක්කේ මහා අවපාතයේ පලමු සිව් වසර තුල බවයි. අනෙක් සිද්ධිය 1987 ඔක්තෝබර් 21 වන දින වාර්තා විය. ඒ, කොටස් වෙළඳපොල ඉතිහාසයේ විශාලතම එක් දින කඩා වැටීම වන සියයට 22 ක් වාර්තා වූ, එම මාසයේම 19 ඊනියා "කලු සඳුදා" ය.

*ජර්නලයට* අනුව 1987 හා 1933 යන වසරවල ඉහල නැඟීම් දෙකකදී පමනක්, "බෙයා වෙළඳපොලවල අවසානය සලකුනු කලේ ය." කෙසේ වුව ද, 1933 දී තරමක් මන්දගාමීව පටන් ගත් ඩව් දර්ශකයේ ඉහල නැඟීම සමඟ තියුනු කඩා වැටීම් ද ඇති විය. දෙවන ලෝක යුද්ධයේ පටන් ගැනීම තෙක් සිදුවූ කොටස් වටිනාකම් වල වර්ධනය, මූලික වශයෙන් මහා අවපාතය අවසන් කිරීමට සමත් නොවී ය. 1929 සැප්තැම්බරයේ ඩව් දර්ශකය අත් කර ගෙන සිටි වටිනාකම් මට්ටම කරා ලඟාවීමට 1955 වන තෙක්ම ඊට නොහැකි විය. 1987 ඔක්තෝබර් 21 බුල් වෙළඳපොලේ ආරම්භය බවට *ජර්නලය* කරන සඳහන ද වැරදිය. එය පන ගසා ඒමට පෙර තවත් කඩා වැටීම් දෙකක් ඇතිවූ අතර 1987 ආරම්භයේ තිබූ වටිනාකම කොටස් වෙළඳපොල තුලට යලි පැමිනීමට පටන් ගත්තේ වසර අවසානයේදී පමනි.

1929 "මහා බිඳවැටීම" අවධියේ විශාල එක් දින නැඟීම් ගනනාවක් ඇතිවූ නමුත් පොදු පරාවක්‍රය පහලට යොමුව තිබුනි. 1929 ඔක්තෝබරයත් 1932 ජූලි මාසයත් අතර කාලයේ, දෙවන විශාලතම ඉහල නැඟීම ලෙස වාර්තා වන, සියයට 15 කින් පමන කොටස් මිල ඉහලට පිනූ 1931 ඔක්තෝබර් 6 ද ඇතුලත්ව සියයට 9 කට වැඩි ඉහල නැඟීම් පහක් සිදු විය. කෙසේ වුව ද, මෙම "රැලිවීම්" පිලිබඳව සිහි තබාගත යුත්තේ, ඒවා බොහෝ ආයෝජකයන් ඔට්ටු අල්ලා පැරදුනු අවස්ථාවන් ගෙන් සමන්විත දිගු කාලීනව පහල බසින සර්පිලයක තාවකාලික සිදුවීම් බවයි. සියයට 82 ක් දක්වා වටිනාකම් අතුගෑවී ගිය, 1932 ජූලි මාසය වන තෙක්ම කෙටස් වෙළඳපොල එහි පතුලට ලඟාවූයේ නැත.

කොටස් වටිනාකම්වල තාවකාලික ඉහල නැඟීම්, ධනවාදයේ සමපේක්ෂන අංගලක්ෂන ඉස්මතු කෙරෙන බව පෙනී යන, අර්බුදයේ අවධීන්හි ලක්ෂනයකි. 1880 වසරේ, *සමාජවාදය, මනෝරාජ්‍යයෙන් විද්‍යාවට* කෘතියෙහි ෆ්‍රෙඩ්රික් එංගල්ස් පෙන්වාදුන් ආකාරයට ධනවාදය, "මහා

සංස්ථාපිතයන් රාජ්‍ය දේපල බවට පරිවර්තනය කරන" අර්බුදයන් "කුපන් කැපීම, ප්‍රතිලාභ සාක්කුවේ දමාගැනීම හා කොටස් හුවමාරුවේ සූදුව මඟින් විවිධවූ ධනපතියන් එකිනෙකාගේ ප්‍රාග්ධනය කොල්ලකා ගැනීම හැරෙන්නට, තව දුරටත් වෙනත් සමාජ කටයුත්තක් නොමැති" තැනකට ඇද වැටෙයි. 19 වන සියවසට වෙනස් ලෙසින්, කම්කරු හා මධ්‍යම පන්තීන්ගේ විශාල කොටස්, සිය ඉතිරිකිරීම් සඳහා කොටස් වෙළඳපොලෙන් ලබාදෙන බවට පොරොන්දු වූ ඉහලම ප්‍රතිලාභ පොරොන්දුව මත සිය විශ්‍රාමික අරමුදල් "කොල්ලකෑමකට" මුහුනපා සිටියි.

© www.wsws.org